කෞමද කුසුම් සිනමා සිත්තම

පළමු වෙලි සිත්තම ලෙස දොරට වැඩිය ඒ කුසුම කෘතහස්ත චිත්‍රපට අධ්‍යක්ෂවරයකු මෙන්ම ප්‍රවීණ නාට්‍ය ශිල්පියෙකු ද වන හිතාල් ප්‍රනාන්දු ගේ අධ්‍යක්ෂණයෙන් ඔප ගැන්වුණි. අපගේ සදාදරණීය දේශයේ සනමා සංගීතය උඩු යටිකුරු කළ මහා සංගීතවේදී ප්‍රේමසිරි කේමදාස යන් ගේ සංගීතයෙන් ඔප ගැන්වුණ මේ අසූරු සිනමා සිත්තමට සිරිල් ධර්මවර්ධන, සනත් වීමලසිරි, මීනා කුමාර, සුජාති මේනකා හා හිතාල් ප්‍රනාන්දු ශ්‍රී ලංකාවෙන් රංගනයෙන් දායක වූ හ.

අන්ධකාරය ආලෝකමත් කරමින් සඳට රැවටිලි බස් දොඩන මල කෞමද කුසුම ය. මිහිස් සිත් සතන් මුසාවෙන් මං මුළා කරමින් සඳවත් රාත්‍රියටත් පමණක් මුළා බස් හෙපුලන ඒ කෞමද කුසුම මෙල්බන් පුරවරය ඇතුළු සමස්ථ ඔස්ට්‍රේලියානු මහාද්වීපයම ආලෝකමත් කිරීමට සූදානම්ව සිටියි.

ඔස්ට්‍රේලියානු මෙල්බන් පුරවරයෙන් බිහි වූ සහජ කලා කුසලතාවන් රැසකට උරුම කම් කියන මෙල්බන් හි ශ්‍රීලාල් කටුනායක මෙහි නිෂ්පාදක වරයා මෙන්ම කැමරා ශිල්පියා ද වෙයි. ඔහුගේ කුළුඳුල් නිර්මාණය වන කෞමද කුසුම් ගෙහි ඇත්තේ විවිධ සිත්තම් වලින් වර්ණවත් වූ නාගරික පවුල් පැලැන්තියක කතාවකි.

මෙහි ප්‍රධාන චරිතයට පණ දෙන සිරිල් ධර්මවර්ධන දූවිලි නාට්‍යයෙන් අප සිත් තුළ සදා නොමැකෙන මතක සටහන් ඇතුල් කළ රංගන ශිල්පියා ලෙස හඳුන්වා දීම හිවැරදිය. කෞමද කුසුමේ සිරිල්ගේ පවුලට පුතෙකු සහ දුවක ඇතුළත්ව සිටිති. සනත් වීමලසිරි හා සුජාති මේනකා මේ චරිත දෙකට පණ පොවති. මේ පවුලේ පරිහානිය අරබඹන්ගේ මවගේ අසම්මත වෙන්ව යාමත් සමග ය. සම්මත ලෝකයේ අසම්මත පැවතුම්න් පරවී මළාහිඟව යන මේ පවුලට ආලෝකය දෙන්නේ කුඩම්මා ය. ඇගේ චරිතය මීනා කුමාර නම් වන දක්ෂ රංග ශිල්පිනියගේ ප්‍රතිභාවෙන් ඔපවත් වෙයි.

ජීවිතයේ සැබෑදාම පැරදී මළාහිඟ මලක් වූ මීනා සැබෑ මව සෙනෙහසින් ආලෝකවත් වී සිරිල් ගේ පවුලට අලුත් ජීවයක්, අලුත් බලාපොරොත්තුවක් ඇති කරයි. මව සෙනෙහසින් තොත් ව

ජීවිතයේ සැබෑ සැබඳතින් ලොවට ඇතුළු නොවූ සිරිල්ගේ දරුවන් කුඩම්මාගේ අවවාද අනුශාසනා නොවස්සීමේ පාපයෙන් දැවී යයි. ජීවිතයට නව අරුතක් සොයා අහිංසක කුඩම්මා ඇතුළු පවුල ඔස්ට්‍රේලියාවට පියමං කරයි.

දරුවන්ගේ දහසක් කෙනෙහිලිකම් වෙනස් කම් අතර අතරමං වූ කුඩම්මා සහ ඇගේම දියණිය අලුත් ලෝකය තුළ අතර මං වනවාද විනාශ වනවාද යන්න අප කෞමද කුසුම් තුළින් බලමු. කෞමද කුසුම් මේ මස 17 වන ඉරිදා සවස 3 ට සහ 6 ට ඩීකින් සරසවියේ බර්වුඩ් මණ්ඩපයේ ලෙක්චර් තියටර් 1 හි දී එකසිත වෙයි.

ගයනා කටුනායක, රෙබෙකා හිරිමලි, රෙක්ස් කොඩිප්පිලි, නෙතලි නානායක්කාර, චිත්‍රා වරකාගොඩ, අනුරාධා උදයංගනී, ප්‍රසන්න ලොහේකා, මෙලනි අසෝකා, රුක්ෂාකි ආරියරත්න, සුසිල් පෙරේරා, බුද්ධික ලොකුකැරිය, සරණපාල ජයසූරිය, සුනෙත් රසාංග , උපේන්ද්‍රා ජයසිංහ, අජිත් සිල්වා, ගාමිණී රණසිංහ, ශ්‍රීසා කටුනායක, ධර්මසිරි ජයසිංහ, තුෂාරි පෙරේරා, හරේන්ද්‍රා ජයසිංහ, දිනේන්ද්‍රා ජයසිංහ, සුනෙත්

රසාංග , චින්තක ගේ රංගනයෙන් කෞමද කුසුම් ඔපවත් වෙයි.

කෞමද කුසුම් පුබුදන්නට රංගනයෙන් දායක වන ගයනා කටුනායක සිතිති දැරිය ඇතුළු මෙල්බන් රංග ශිල්පීන්ගේ දක්ෂතාවයන් එළින ඔබට දැක ගත හැකි වනු ඇත.

ශ්‍රියා ගලප්පත්ති

Want to get PR...?

Are you worried about
- Not enough points to apply for Permanent Residency?
- 60 points for occupation?

Have you completed your course?
Do you have Relatives or Friends in Sri Lanka?
Offshore Skilled Migration Visa

Who has one or/ and more of the following?

- A Trade Certificate/ Diploma/ Degree or Professional/ Technical Qualification?
- Have 1/3/4/6 year(s) experience in a skilled occupation or business?
- Below 45 years
- Good knowledge of English
- Blood Relative in Australia

Time to contact
Hirosh H. Gamage ASA, AAIBF (Snr), MMIA
Multinational Migration Services
20/215, Betula Avenue, Mill Park, Vic 3082, Australia

On 03 94704422 or Fax 03 94704422
Or Contact Bathiya at our
Permanent Office in Sri Lanka
On 94-11-2372759



Business & Other Migration
Business Owners & Investors/ Visitors/ Spouse/ Parents/ Distinguished talent/ Remaining Relative Visa

Student Migration
Please contact our staff at Colombo office for further details (FREE SERVICE)

AUSTRALIAN MIGRATION SERVICES
388, (1st Floor), Galle Road, Colombo 03
(In front of Laxshaman's Building)
Tel: 011 2372759 Fax: 011 2372759
E-mail: info@multinational.com.au

Registered Migration Agent No: 0320696

MIA MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA

For More details or FREE Online Assessment Visit Our Web Site www.multinational.com.au